ISSN 1800 – 4067

# THE ROYAL ASIATIC SOCIETY OF SRI LANKA

6th Research Conference

28th - 30th March 2013

# ABSTRACTS

Royal Asiatic Society of Sri Lanka
96, Ananda Coomaraswamy Mawatha
Colombo 07, Sri Lanka

# ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

# A Historical Study on the Publication of Books in Sri Lanka

ඒ. එස්. රූපසිංහ[1]

අනාදිමත් කාලයක සිට මිනිසා තම අදහස් හා මතවාද අන් අයට දැන ගැනීමට සැලැස්වීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කළේය. එසේ විකාශය වූ සන්නිවේදන ක්‍රමවල එක් ප්‍රතිඵලයක් ග්‍රන්ථ බිහිවීම. එක් අතකින් එම සිදුවීම, අදහස් හා මතවාද ලේඛනගත කිරීම සඳහා උපයෝගීකර වූ අතර අනෙක් අතින් ඒවා තවත් පුද්ගලයෙක් වෙත සන්නිවේදනය කිරීම සඳහා යොදාගත හා ලැබූ ප්‍රබල මාධ්‍යයක් බවට ද පත් විය. ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය ආරම්භ වූයේ මෙම ආකාරයට මිනිසා සතු දැනුම සහ බුද්ධිය අතිවිශාල පිරිසක් සමඟ බෙදාගැනීමේ අවශ්‍යතාවය මූලික කරගෙන ය.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගයේ අවසානය දක්වා ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයක් පැවතියේ ද එසේ පැවතියේ නම් එය විකාශය වූ ආකාරය කෙබඳු ද යන්නත් විමර්ශනය කිරීම ය. එම ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමේ දී ශ්‍රී ලංකාවේ ඒ ඒ රාජධානි යුගවල ලේඛන කලාව සහ ග්‍රන්ථ ප්‍රකාශනය ගැන වෙන වෙන ම සලකා බලන ලදී.

අධ්‍යයනය සඳහා මූලික වශයෙන් ම ඓතිහාසික මූලාශ්‍රයන් උපයෝගී කරගත් එහිලා මහාවංසය ඇතුළු වංශකථා හා පාලි අට්ඨකථා ද පැරණි සාහිත්‍ය ග්‍රන්ථ ද උපයෝගී කරගන්නා ලදී. ශ්‍රී ලංකාවේ රාජධානි යුග අතුරින් අනුරාධපුරය, කෝට්ටේ සහ මහනුවර යන රාජධානි තුන තෝරාගෙන එම කාල පරිච්ඡේදය තුළ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ තත්ත්වයන් විමර්ශනය කරන ලදී. මෙම විමර්ශනයෙන් හෙළිවූ තොරතුරු සාකච්ඡා කිරීම මේ පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ යි.

මුඛ්‍ය පද: ග්‍රන්ථ ප්‍රකාශනය, ලේඛන කලාව, මුඛපරම්පරාගත ක්‍රමය , ඉතිහාසය

**Keywords:** Publication of Books, Literature, Transfer of knowledge by word of mouth

1 සහකාර පුස්තකාලයාධිපති, පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
Email: sajeewanie@kln.ac.lk